*සැ. යු.-* 2022.07.15 දින පළ කරන ලද අංක 2289 *ගැසට් පත්‍රයේ* I-II (අ) හා IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,290 - 2022 ජූලි මස 22 වැනි සිකුරාදා - 2022.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 966 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 969 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අගෝස්තු මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිමඩ

2022 යල කන්න රැස්වීම් තීරණ දැනුම් දීම - මහඑළිය ව්‍යාපාරය

රට තුළ පවතින කෝවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හා ඉන්ධන හිඟකම ඇතුළු තත්වයන් සැලකිල්ලට ගෙන මෙවර 2022 යල කන්න රැස්වීම නොපැවැත්වූ අතර, පහත පෙර කන්න රැස්වීම් තීරණ 2022 යල කන්න රැස්වීම් තීරණ සේ සලකා කන්නය ආරම්භ කිරීමට තීරණය කරන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා අදාළ ගොවි සංවිධාන විසින් නඩත්තු වැඩ අවසන් කිරීමට යෝජිත දිනය | - | 2022.07.02 |
| 2. | පෙර කන්නවල වගා රටා වලට අනුකූලව කන්නයේ වගා කිරීම සඳහා යෝජිත ප්‍රදේශ | - | අක්කර 540 |
| 3. | වගා කිරීමට යෝජිත භෝග හා භෝග වර්ගය | - | අර්තාපල් හා මිශ්‍ර එළවළු |
| 4. | ජලය නිකුත් කිරීමට යෝජිත ආරම්භක දිනය | - | 2022.07.04 |
| 5. | බිම් සකස් කිරීමට යෝජිත අවසාන දිනය | - | 2022.07.30 |
| 6. | භෝග සිටුවා අවසන් කිරීමට නියමිත අවසාන දිනය | - | 2022.08.05 |
| 7. | මුර ජලය නිකුත් කිරීම සඳහා යෝජිත දිනය | - | 2022.07.04 |
| 8. | ජලය නිකුත් කිරීමට යෝජිත අවසාන දිනය | - | 2022.11.30 |
| 9. | ඇළ වේලි ශුද්ධ නොකිරීම සඳහා වූ දඩය (බඹයකට) | - | රු. 2,500.00 (දිනක වැටුප) |

ඩබ්. එම්. සී. වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2022 ජුනි මස 27 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 283

---

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිමඩ

2022 යල කන්න රැස්වීම් තීරණ දැනුම් දීම - දඹවින්න ව්‍යාපාරය

රට තුළ පවතින කෝවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හා ඉන්ධන හිඟකම ඇතුළු තත්වයන් සැලකිල්ලට ගෙන මෙවර 2022 යල කන්න රැස්වීම නොපැවැත්වූ අතර, පහත පෙර කන්න රැස්වීම් තීරණ 2022 යල කන්න රැස්වීම් තීරණ සේ සළකා කන්නය ආරම්භ කිරීමට තීරණය කරන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා අදාළ ගොවි සංවිධාන විසින් නඩත්තු වැඩ අවසන් කිරීමට යෝජිත දිනය | - | 2022.07.12 |
| 2. | වගා කිරීම සඳහා යෝජිත භූමි ප්‍රමාණය | - | අක්කර 250 |
| 3. | වගා කිරීමට යෝජිත භෝග හා භෝග වර්ගය | - | මිශ්‍ර එළවළු |
| 4. | ජලය නිකුත් කිරීමට යෝජිත ආරම්භක දිනය | - | 2022.07.15 |
| 5. | බිම් සකස් කිරීමට යෝජිත අවසාන දිනය | - | 2022.07.30 |
| 6. | භෝග සිටුවා අවසන් කිරීමට නියමිත අවසාන දිනය | - | 2022.08.05 |
| 7. | මුර ජලය නිකුත් කිරීම සඳහා ආරම්භක දිනය | - | 2022.07.12 |
| 8. | ජලය නිකුත් කිරීමට යෝජිත අවසාන දිනය | - | 2022.10.30 |
| 9. | ඇළ වේලි ශුද්ධ නොකිරීම සඳහා වූ දඩය (වී අක්කරයක් සඳහා) | - | රු. 8,000.00 |

ඩබ්. එම්. සී. වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2022 ජුනි මස 20 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 284

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කුරුණෑගල**

වන්දනා ගමන් ආඥාපනත

**ඓතිහාසික විල්බාව ශ්‍රී පත්තිනි මහා දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය - 2022**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික විල්බාව ශ්‍රී පත්තිනි මහා දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය 2022 අගෝස්තු මස 13 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. පී. සී. උදය කුමාර,  
ප්‍රාදේශීය ලේකම්,  
කුරුණෑගල.

2022 ජූලි මස 06 වැනි දින,  
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-379

---

**මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත

**රුහුණු මහා කතරගම දේවාලයේ ඇසළ උත්සවය - 2022**

ඉහත සඳහන් උත්සවය 2022 ජූලි මස 29 වැනි දිනෙන් ආරම්භ වී 2022 අගෝස්තු මස 12 වැනි දින නිමාවට පත්වන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥා පනතේ විධිවිධාන අනුව පහත සඳහන් *ගැසට්* පත්‍රවල ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

1948 අප්‍රේල් මස 30 දින පළ වූ 9859 දරන *ගැසට්* පත්‍රය  
1949 ජූලි මස 22 දින පළ වූ අංක 10000 දරන *ගැසට්* පත්‍රය  
1958 පෙබරවාරි මස 07 දින පළ වූ අංක 11255 දරන *ගැසට්* පත්‍රය  
1961 ජූලි මස 07 දින පළ වූ අංක 12508 දරන *ගැසට්* පත්‍රය  
1962 මාර්තු මස 02 දින පළ වූ අංක 12947 දරන *ගැසට්* පත්‍රය

ගුණදාස සමරසිංහ,  
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/ දිසාපති සහ කතරගම  
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරි.

2022 ජුනි මස 30 වැනි දින,  
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

**රුහුණු මහා කතරගම දේවාලයේ ඇසළ උත්සවය - 2022**

1948 අප්‍රේල් මස 30 දින පළවූ අංක 9859 දරන *ගැසට්* පත්‍රය, 1949 ජූලි මස 22 දින පළ වූ අංක 10000 දරන *ගැසට්* පත්‍රය, 1958 පෙබරවාරි මස 07 දින පළ වූ අංක 11255 දරන *ගැසට්* පත්‍රය, 1961 ජූලි මස 07 දින පළ වූ අංක 12508 දරන *ගැසට්* පත්‍රය, 1962 මාර්තු මස 02 දින පළ වූ අංක 12947 දරන *ගැසට්* පත්‍රය යන ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රවල පළ වූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධව පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. **කඳවුරු ප්‍රදේශය යනු ;**

(අ) කතරගම මැණික් ගඟේ පැරණි තොටුපලේ සිට කිලෝමීටර් 1.6ක අර්ධ විශ්කම්භයකින් වට වූ ප්‍රදේශය හා,

(ආ) සෙල්ලකතරගම පුල්ලෙයාර් කෝවිලේ සිට කිලෝමීටර් 0.4ක අර්ධ විශ්කම්භයකින් වට වූ ප්‍රදේශය.

02. **ගොඩනැගිලි ඉදි කිරීම ;**

මාගෙන් හෝ බලය ලත් නිලධාරියෙකුගෙන් ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2022 ජූලි මස 29 වැනි දින සිට 2022 අගෝස්තු මස 12 වැනි දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳසැලක් ඉදි නොකළ යුතු ය.

03. **යාචකයෝ ;**

කතරගම මැණික් ගඟේ 02 වන පාලම අසල තනා ඇති යාචක මඩුව තුළ හෝ ඒ මඩුවේ සිට මීටර් 4ක් ඇතුළත මිස, පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීම ද නොකළ යුතු යි.

04. **නෑම සහ සේදීම.**

මැණික් ගඟේ කතරගම ජලසම්පාදන ක්‍රමය හරහා ජලය ලබා ගන්නා ස්ථානයට සහ ඊට ඉහලින් කිලෝමීටර් 4.8ක ප්‍රදේශය තුළ මැණික් ගඟේ කිසිවෙකු දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම නොකළ යුතු ය.

05. **වාහන :**

5.1 මාගේ හෝ බලයලත් නිලධාරියකුගෙන් ලබා ගත් අවසරයක් රහිතව කිසිවකු විසින් මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (මැණික් ගඟේ නැගෙනහිර පෙදෙසට) පැදවීම හෝ ඇතුල් කිරීම නොකළ යුතු ය.

5.2 කඳවුරට අයත් නව නගරයේ වාහන නතර කිරීමට වෙන් කර ඇති රිය ගාල් වල හැර කිසිදු වාහනයක් වෙනත් ස්ථානයක නතර කර නොතැබිය යුතු ය.

06. **කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානය :**

කඳවුරු පෙදෙසේ මවිසින් අවසර දුන් ස්ථානයේ හැර කිසිවෙකු විසින් කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක් පිහිටවනු නොලැබිය යුතු ය.

07. **කාවාඩි කඩ :**

මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවකු විසින් කාවාඩි කඩ පිහිටවනු නොලැබිය යුතු ය.

08. **වෙළඳාම :**

8.1 පූජා පෙදෙස, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලා ප්‍රදේශය, නැවතුම්පොල, අංක 1 හා 2 මගී පාලම්වල මාර්ගය යන ස්ථානවල සංචාරක වෙළඳාම තහනම් ය.

8.2 මවිසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තිත්තෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතු ය.

8.3 කිරි වෙහෙරට පිවිසුම් මාර්ගය දෙපසේ දැනට තනා ඇති මල් අලෙවි සැල්වල මල් අලෙවි කිරීම හැර කිසිවෙකු විසින් පූජා නගරය තුළ කඩයක් තැනීම, පවත්වාගෙන යාම, කිසිවක් වෙළඳාම් කිරීම නොකළ යුතු ය.

8.4 සෑම ගොඩනැගිල්ලකම හා සෑම වෙළඳසැලකම කසල බඳුනක් තිබිය යුතු අතර, ස්ථානයේ අපද්‍රව්‍ය එහි බහාලිය යුතු ය.

8.5 විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතු ය.

ගුණදාස සමරසිංහ,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/ දිසාපති සහ කතරගම
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2022 ජූනි මස 30 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-480

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
## මාතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : ආරච්චිගේ ජයත් ජයසිංහ

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2022 ක්වූ අප්‍රේල් මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ආරච්චිගේ ජයත් ජයසිංහ යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එච්. එම්. එම්. කේ. කාරියවසම් විසින් සහතික කරන ලද වර්ෂ 2017.02.23 දිනැති අංක 072 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2017.12.28 දිනැති අංක 183 දරන ද්විතීයන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බැන්කිං කොපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 072 සහ 183 දරන උකස්කරයන් මත,

1. (i) වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් විසිහය ලක්ෂ අසූ දෙදහස් හාරසිය හතලිස් දෙකයි ශත හතලිස් දෙක (රු. 2,682,442.42)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 2,489,769.15ක මුදල මත වර්ෂයකට 15.5%ක පොළිය ද,

   (ii) වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හත්ලක්ෂ දෙදහස් තුන්සිය අනූපහයි ශත දහතුන (රු. 702,395.13)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 663,207.66ක මුදල මත වර්ෂයකට 8.11%ක පොළිය ද,

   (iii) වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ තිස් අටදහස් එකසිය හැට තුනයි ශත හැත්තෑව (රු. 538,163.70)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 514,849.91ක මුදල මත වර්ෂයකට 15.5%ක පොළිය ද,

2. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හාර ලක්ෂ දහ හතර දහස් හත්සිය විසි අටයි ශත පහ (රු. 414,728.05)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 300,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

3. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් පන් දහස් නවසිය හැත්තෑ තුනයි ශත හැත්තෑ හත (රු. 555,973.77)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

4. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් එක්දහස් අටසිය හතලිස් දෙකයි ශත හැට තුන (රු. 551,842.63)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

5. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් දෙදහස් එකසිය දහ අටයි ශත තිස් හත (රු. 552,118.37)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

6. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් එක් දහස් අටසිය හතලිස් දෙකයි ශත හැට දෙක (රු. 551,842.62)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

7. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හය ලක්ෂ විසි දහස් අටසිය විසිදෙකයි ශත අනූ හතර (රු. 620,822.94)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 450,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

8. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් හය දහස් පන්සිය හැට තුනයි ශත අනූ තුන (රු. 556,563.93)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

9. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් හය දහස් පන්සිය හැට තුනයි ශත අනූ තුන (රු. 556,563.93)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

10. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හය ලක්ෂ අනූ පන්දහස් හාරසිය විසි නවයයි ශත හැත්තෑ හය (රු. 695,429.76)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 500,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

11. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් පන් දහස් එකසිය අසූ හයයි ශත අසූ අට (රු. 555,186.88)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

12. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ පනස් තුන් දහස් විසි දෙකයි ශත අනූ හතර (රු. 553,022.94)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 400,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

13. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හාර ලක්ෂ අසූ හත් දහස් පන්සිය නවයයි ශත අසූ තුන (රු. 487,509.83)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 350,000.00ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

14. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දෙලක්ෂ හැත්තෑ අටදහස් තුන්සිය අසූවයි ශත තිස් තුන (රු. 278,380.33)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 278,380.33ක මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

15. වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් නව ලක්ෂ විසි එක් දහස් හයසිය හැට පහයි ශත දහතුන (රු. 921,665.13)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 888,888.88ක මුදල මත වර්ෂයකට 6%ක පොළිය ද,

16. (i) වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් තිස් පන් ලක්ෂ දහහත් දහස් දෙසිය විසි නවයයි ශත අට (රු. 3,517,229.08)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රුපියල් මිලියන තුන (රු. 3,000,000.00)ක සීමාව දක්වා වූ වර්ෂයකට 13% ක පොළිය ද, රුපියල් මිලියන තුන (රු. 3,000,000.00) ඉක්මවන මුදල මත වර්ෂයකට 28%ක පොළිය ද,

(ii) වර්ෂ 2022.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එක් ලක්ෂ හතලිස් පන්දහස් එකසිය අසූ හයයි ශත විසි හත (රු. 145,186.27)ක මුදලක් ද, වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 142,793.04ක මුදල මත වර්ෂයකට 6%ක පොළිය ද,

ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු මුළු මුදල වන රුපියල් පහළොස් මිලියන හාර ලක්ෂ තිස් හත් දහස් හැට හතයි ශත හැත්තෑ එක (රු. 15,437,067.71)ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව, කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, මාතර මහ නගර සභා සීමාවේ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙලේගොඩ නැගෙනහිර අංක 8 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැලිවේරිය ග්‍රාමයේ පිහිටි වෙලේගොඩ පාර, වරිපනම් අංක 7 දරන වැලිවේරියවත්ත නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එම්. විමලසූරිය විසින් සම්පාදිත 1977.09.26 දිනැති අංක 1835ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 නැමැති උතුරින් : වෙලේගොඩ පාර (සුනන්ද පාර) ද, නැගෙනහිරින් : ඩබ්ලිව්. එම්. ඩී. අදිරියන් අප්පුහාමි හිමිකම් කියන ඉඩම (පෙර ඩබ්ලිව්. ජී. ධනේරිස් හිමිකම් කී ඉඩම) ද, දකුණින් : ඇලහේන ද, බස්නාහිරින් : මෙම ඉඩමෙහි ලොට් 2 ද මායිම් වූ එකී පිඹුරු අංක 1853ඒ දරන පිඹුර පරිදි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම අට (පර්. 14.80)ක විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්‍රිරු A 797/88හි ලියාපදිංචිව ඇත.

මෙම ඉඩම මෑතක දී කරන ලද මැනීමක් පරිදි බලයලත් මිනින්දෝරු එන්. එච්. කොඩිප්පිලි විසින් සම්පාදිත 2007.05.03 දිනැති අංක 549 දරන පිඹුරේ ඉහත පරිදි විස්තර කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අරුණ ගුරුගේ,
සහකාර කළමණාකරු - ණය අයකර ගැනීම්.

07-389

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
## රාජගිරිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණණුදෙනුකරුගේ නම : වේවැල්වල හේවගේ රංජන දිමුතුරත්න

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2022.04.26 වැනි දින විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව

වර්ෂ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, වේවැල්වල හේවගේ රංජන දිමුතුරත්න බන්ධනදායී සහ උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.08.23 දිනැති අංක 1458 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2019.03.01 දිනැති අංක 1551 දරන ද්විතීයික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉනම් එකී අංක 1458 සහ 1551 දරන උකස් බැඳුම්කරයන් මත, ගෙවිය යුතු මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය තෙක්,

(අ) වර්ෂ 2022.03.31 දින වන විට රුපියල් හතර මිලියන හත් ලක්ෂ විසිපන් දහස් එකසිය හැත්තෑ අටයි ශත තිස්දෙක (රු. 4,725,178.32)ක මුදලක් සමග රු. 4,412,424.48ක මුදල මත වර්ෂ 2022.04.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 19% බැගින් පොලිය ද, සහ 2022.03.31 දින වන විට රුපියල් තුන් ලක්ෂ අසූ දහස් නවසිය හතළිස් හතරයි ශත තිස් අට (රු. 380,944.38)ක මුදලක් සමග රු. 359,599.64ක මුදල මත වර්ෂ 2022.04.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 19% බැගින් පොලිය ද,

(ආ) වර්ෂ 2022.03.31 දින වන විට රුපියල් පස් මිලියන දෙලක්ෂ පනස්පන් දහස් දෙසිය තිහයි ශත දහතුන (රු. 5,255,230.13)ක මුදලක් සමග රු. 4,834,048.97ක මුදල මත වර්ෂ 2022.04.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 17.5% බැගින් පොලිය ද, සහ වර්ෂ 2022.03.31 දින වන විට රුපියල් හාරලක්ෂ නවදහස් එකසිය නවයයි ශත පනස් පහ (රු. 409,109.55)ක මුදලක් සමග රු. 380,685.70ක මුදල මත වර්ෂ 2022.04.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 17.5% බැගින් පොලිය ද,

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 1458 සහ 1551 දරන උගස් බැඳුම්කරයන් මත අයවිය යුතු එකී රුපියල් දස මිලියන හත් ලක්ෂ හැත්තෑ දහස් හාරසිය හැට දෙකයි ශත තිස් අට (රු. 10,770,462.38)ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද, වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ වේවැල්වල හේවගේ රංජන දිමුතුරත්න යන අය බන්ධනදායී සහ උකස්කරු වශයෙන් බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, (හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගලවිලවත්ත උතුර - 486 සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සමන් මාවත, වරිපනම් අංක 9/24 දරන හෝමාගම ගමෙහි පිහිටා ඇති 'ගලවිල ස්ටේට් (කොටස)' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වී. ඒ. එන්. සමන්ති විසින් මැන සාදන ලද 2016.05.17 දිනැති පිඹුරු අංක 1189ඒ දරන පිඹුරෙහි ලොට් අංක 01 (බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1971 ජුනි මස 28 සහ 29 සහ ජූලි මස 08 වැනි දිනැති සහ පිඹුරු අංක 899 දරන පිඹුරෙහි ලොට් අංක 3හි බෙදා වෙන් කිරීමකි) යනුවෙන් නිරූපිත ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : මෙහිම ලොට් 2 සහ 5 ද, දකුණට : ඉහත කී පිඹුරු අංක 899 හි ලොට් ආර් 2 (පාර) ද, සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 899 හි ලොට් 2 ද, යන මෙකී මායිම් තුළ පිහිටි එකී පිඹුරු අංක 1189ඒ ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් අට (පර්.8)ක් වූ බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ආදී සෑම සියලු දේද සමග වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු A 703/97හි ලියාපදිංචිකර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1971 ජුනි මස 28 සහ 29 සහ ජූලි මස 08 වැනි දිනැති පිඹුරු අංක 899 දරන පිඹුරෙහි ලොට් අංක ආර් 2 (පාරක් සඳහා වෙන් කරන ලද) දරන ඉඩම් කොටස මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිවාසිකම් ද සමඟ වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු G 726/200හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණී - ණය අයකර ගැනීම්.

07-390